**2026-03-09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සම්බන්ධ කර ගැනීම**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්, එහෙත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට අවස්ථාව නොලබන සිසුන් සඳහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක රජය විසින් පිළිගත් උපාධි පාඨමාලාවක් හැදෑරීම පිණිස පොලී රහිත ශිෂ්‍ය ණය ලබා දීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි. දැනට එම ණය යෝජනා ක්‍රමයේ ණය මුදල් ප්‍රදානය කරනු ලබන බැංකු වශයෙන් මහජන බැංකුව සහ ලංකා බැංකුව කටයුතු කරනු ලැබේ. එම ණය යෝජනා ක්‍රමයේ 10වන අදියර යටතේ සිසුන් 7,000ක් සඳහා ණය පහසුකම් සලසා දීමට සැලසුම් කර ඇත. ඒ අනුව, මහජන බැංකුව සහ ලංකා බැංකුවට අමතරව එම ණය යෝජනා ක්‍රමය යටතේ සිසුන් වෙත ණය මුදල් ප්‍රදානය කරනු ලබන බැංකුවක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව ද සම්බන්ධ කර ගැනීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. රාජ්‍යතාන්ත්‍රික, රාජකාරි සහ සේවා විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයන් වීසා ලබා ගැනීමෙන් නිදහස් කිරීම පිණිස ශ්‍රී ලංකාව සහ නේපාල රජය අතර ගිවිසුමකට එළඹීම**

ශ්‍රී ලංකාව සහ නේපාල රජය අතර පවතින මිත්‍රශීලී සහයෝගිතාවයෙහි වැදගත්කම හඳුනා ගනිමින්, රාජකාරිමය කටයුතු වෙනුවෙන් දෙරට අතර සිදු කරනු ලබන ගමනාගමනය සඳහා පහසුකමක් සැලසීමත්, වීසා ලබා ගැනීමේදී සිදු වන අනවශ්‍ය බාධාවන් ඉවත් කර ගැනීමත් අරමුණු කරගනිමින් ශ්‍රී ලංකාව සහ නේපාලය අතර ගිවිසුමකට එළඹීම පිණිස දෙරටේ අදාළ පාර්ශ්වයන් විසින් එකඟතාවකට පැමිණ තිබේ. ඒ අනුව, දෙරටෙහිම රාජ්‍යතාන්ත්‍රික, රාජකාරි සහ සේවා විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයින්හට වීසා ලබා ගැනීමකින් තොරව දින 30ක් නොඉක්මවන කාලසීමාවක් සඳහා අනෙක් ගිවිසුම්ගත පාර්ශ්වයේ භූමි ප්‍රදේශය වෙත පිවිසීමට, ඒ හරහා ගමන් කිරීමට හා රැඳී සිටීමට හැකියාව ලැබෙන පරිදි ශ්‍රී ලංකාව සහ නේපාලය අතර ගිවිසුමකට අත්සන් තැබීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

## 03. විද්‍යාව මත පදනම් වූ ආපදාවන්ට ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන උපායමාර්ගික රාමු ක්‍රියාත්මක කිරීම

2025 නොවැම්බර් මස අවසානයේදී ඇති වූ 'දිට්වා' නිවර්තන සුළි කුණාටුව හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් ආසන්න වශයෙන් මිලියන 2.3ක ජනතාවකට බලපෑම් එල්ල වූ අතර රටට සිදු වූ සමස්ත ආර්ථික හානිය ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ. එම ආපදා අවස්ථාවේදී දිවයිනේ තීරණාත්මක වැදගත්කමකින් යුත් යටිතල පහසුකම්වලට, කෘෂිකාර්මික හා පාරිසරික ක්ෂේත්‍රයන්ට මෙන් ම කඳුකර සහ වෙරළබඩ පරිසර පද්ධතිවලට දැඩි හානි සිදු වූ අතර, අදාළ සිදුවීම ජාතික යටිතල පහසුකම්වල පවතින තීරණාත්මක පද්ධතිමය දුර්වලතාවන් අනාවරණය වූ දේශගුණික ආතති පරීක්ෂණයක් (Climate Stress Test) වශයෙන් හඳුනාගත හැක. එබැවින්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණය කිරීමේ කාර්යය, 'ප්‍රතිචාර සහ ප්‍රතිසාධනය' පදනම් කර ගත් ආපදා ඇති වූ පසු ප්‍රතිචාර දැක්වීමේ ආකෘතියේ සිට 'විද්‍යාව මත පදනම් වූ ආපදා හටගැනීමට පෙර ඒ සඳහා ඔරොත්තු දීමේ' රාමුවක් බවට පරිවර්තනය කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කරනු ලැබ ඇති අතර, එකී වැඩසටහන සඳහා 2026-01-12 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, 'දේශගුණික ආතති පරීක්ෂණයක් ලෙස දිට්වා සුළි කුණාටුවෙන් උගත් පාඩම්' යන තේමාව ඔස්සේ 2026-01-14 දින ආයතනික පර්යේෂණ අවශ්‍යතා ඇගයීමේ ජාතික වැඩසටහනක් පවත්වා ඇත. එම වැඩසටහන අධීක්ෂණය සඳහා පත් කරනු ලැබ ඇති කමිටුව විසින් විද්‍යාව මත පදනම් වූ ආපදාවන්ට ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන උපායමාර්ගික පර්යේෂණ සහ පද්ධති සංවර්ධනය සඳහා වන නිර්දේශ 07කින් සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ සක්‍රිය කිරීම සම්බන්ධයෙන් වන නිර්දේශ 07කින් යුතු ව සිය වාර්තාව ඉදිරිපත් කරනු ලැබ තිබේ. ඒ අනුව, එකී ද්විත්ව මාර්ග ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම පිණිස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. 2026-2028 සඳහා සංචාරක සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

තිරසර සංචාරක කර්මාන්තයක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක විභවතාව පවතින ගමනාන්ත හඳුනා ගෙන ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කරමින් පළාත් 09ම ආවරණය වන පරිදි 2026-2028 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම පිණිස සංචාරක සංවර්ධන වැඩසටහනක් සකස් කරනු ලැබ ඇත. ඒ සඳහා මුළු දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන 2,667.03ක් වේ. එමෙන්ම, යාපනය දිස්ත්‍රික්කය තුළ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 131.02ක ඇස්තමේන්තුගත වියදමකින් යුතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී තිබේ.

ඒ අනුව, එම සංචාරක සංවර්ධන වැඩසටහන 2026-2028 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම පිණිස සහ යාපනය දිස්ත්‍රික්කය තුළ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ කාර්යයන් ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ ස්ථාපිත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් එකී කොමිෂන් සභාව වෙත පනතේ ප්‍රතිපාදන යටතේ ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීම හා ඒ සම්බන්ධයෙන් තීරණයන්ට එළඹීම සිදු කරනු ලබයි. ඒ සඳහා දැනට කොමිෂන් සභාව සතුව පවතින තාක්ෂණික මෙවලම්වල සීමිත බව හේතුවෙන් අභියාචනා විභාග කිරීමේ ක්‍රියාවලිය ඇතුළු සමස්ත ක්‍රියාවලිය ලේඛනගතව සිදු කරමින් පවතී. එබැවින්, කොමිෂන් සභාවේ රාජකාරි කටයුතු කාර්යක්ෂම කිරීමේ අරමුණ සහිත ව එහි මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට මේ වන විට සැලසුම් කර ඇති අතර, යෝජිත ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ නිර්දේශ මත 'විවෘත සමාජ පදනම' (Open Society Foundation) විසින් ඇමෙරිකානු ඩොලර් 200,000ක ප්‍රදානයක් ලබා දීමට එකඟතාව පළ කරනු ලැබ තිබේ. ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය යන්ත්‍ර උපාංග මිලදී ගැනීම, මෘදුකාංග සංවර්ධනය කිරීම, අත්‍යවශ්‍ය මානව සම්පත් විශේෂඥ දැනුම ලබා ගැනීම සහ වත්මන් කාර්යමණ්ඩල ධාරිතා සංවර්ධනය යන කාර්යයන් සඳහා එකී ප්‍රදානය යොදා ගැනීමට සැලසුම් කර ඇත. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරි වසම් 20කින් හා ගම්මාන 129කින් සමන්විත වන අතර, ආසන්න වශයෙන් එහි මුළු ජනගහනය 39,700ක් පමණ වේ. ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ වන විට වර්ගඅඩි 10,869ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් පැරණි ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර, එහි ඉඩකඩ සීමිත වීම හා පහසුකම් අවම මට්ටමක පැවතීම මත රාජකාරි කටයුතු ඵලදායි ලෙස පවත්වාගෙන යාමට සහ මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමට බාධාවන් මතු වී තිබේ. එමෙන්ම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි පිටුපස පිහිටි අඩි 20ක් පමණ උස් වූ පස් ඉවුර නාය යාමේ අවදානම හේතුවෙන්

ගොඩනැගිලිවලට හානි විය හැකි බවටත්, එය ස්ථායි කිරීම සඳහා රඳවුම් බැම් යෙදිය යුතු බවටත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් උපදෙස් ලබා දී ඇත. එබැවින්, දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කර ඇති භූමියේ පවතින පැරණි ගොඩනැගිලි කඩා ඉවත් කර, පවතින භූමියේ භූ විෂමතාව සැලකිල්ලට ගනිමින් වර්ගඅඩි 25,000ක පමණ වපසරියකින් යුත් නව කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් හා වර්ගඅඩි 1,600ක පමණ වපසරියකින් යුත් ප්‍රාදේශීය ලේකම් නිල නිවසක් ඉදිකිරීමටත් සැලසුම් කර තිබේ. ඒ අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, එම ව්‍යාපෘතිය 2026 වර්ෂයේදී ආරම්භ කර 2028 වර්ෂයේදී අවසන් කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

07. **බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීම**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගෙන, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස දැනට සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී සුනිල් ගලගම මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

08. **අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීම**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගෙන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන අතිරේක කොමසාරිස් ජනරාල් ලෙස දැනට සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී අනුපම මංගල වික්‍රමාරච්චි මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

09. **නායයෑම් සහ නායයෑමේ අධි අවදානම හේතුවෙන් පවුල් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවසක් ඉදිකිරීම සඳහා ගෙවනු ලබන මුදල සංශෝධනය කිරීම**

නායයෑම් සහ නායයෑමේ අධි අවදානම හේතුවෙන් සිය පදිංචි ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයක පදිංචි කළ යුතු පවුල් හඳුනාගෙන නැවත පදිංචි කිරීමේ වැඩසටහන ප්‍රතිලාභියා විසින් නිවස ඉදිකර ගැනීමේ ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. එම වැඩසටහන යටතේ එක් නිවසක් ඉදිකිරීම සඳහා උපරිම වශයෙන් රුපියල් මිලියන 1.6ක මුදලක් හඳුනාගනු ලබන ප්‍රතිලාභී පවුලක් සඳහා ලබා දෙන

අතර, එම මුදල එක් නිවසක් සඳහා රුපියල් මිලියන 2.5 දක්වා ඉහළ නැංවීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **මැදපෙරදිග හරහා සිදු කරන ගුවන් ගමන් අවලංගු කිරීමෙන් බලපෑමට ලක්වූ විදේශිකයින් සඳහා ගාස්තු අය නොකිරීමේ පදනම මත වීසා වලංගු කාලසීමාව දීර්ඝ කිරීම**

මැදපෙරදිග කලාපයේ මේ වන විට පවතින යුද්ධමය වාතාවරණය හේතුවෙන් එම කලාපය වෙත 2026-02-28 දින සිට ගුවන් ගමන් අවලංගු කිරීම නිසා මෙරටින් පිටත්ව යාමට නියමිතව සිටි ඇතැම් විදේශිකයින්හට ඔවුන්ගේ වීසා බලපත්‍රවල වලංගු කාලය අවසන් වීමට පෙර රටින් බැහැර වීමට නොහැකි වී ඇත. එම සුවිශේෂී තත්ත්වය සැලකිල්ලට ගනිමින්, එවැනි මගීන්ට විකල්ප ගමන් විධිවිධාන සකස් කර ගැනීමට හැකි වන තෙක් ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූලව රැඳී සිටීම සඳහා පහසුකම් සැලසිය යුතුව තිබේ. ඒ අනුව, 2026-02-28 දින සිට මැදපෙරදිග බලා පිටත් වන ගුවන් ගමන් අවලංගු කිරීම හේතුවෙන් මෙරටින් පිටවීමට නොහැකි වූ විදේශිකයින්හට දින 14ක කාලයක් සඳහා ගාස්තු අය කිරීමකින් තොරව වීසා දීර්ඝ කිරීම් ලබා දීමටත්, තවදුරටත් එවැනි ගුවන් ගමන් අවලංගුකිරීම් පවතී නම්, ඔවුන්ගේ වීසා දීර්ඝ කිරීමේ කාලය තවත් දින 14ක් දක්වා ගාස්තුවකින් තොරව දීර්ඝ කිරීමටත් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් තේ, පොල් සහ රබර් යන කෘෂි අපනයන භෝග නැවත වගාව සඳහා සහන සැලසීම**

2025 නොවැම්බර් මස අග භාගයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් හානියට පත් ක්ෂේත්‍ර භෝග, එළවළු සහ පළතුරු වගාවන් කඩිනමින් නැවත වගා කිරීම සඳහා ගොවීන් වෙත සහන සැලසීමටත්, එම ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් වූ ගම්මිරිස්, කෝපි සහ කරදමුංගු වැනි සුළු අපනයන භෝග නැවත වගාවන් සඳහා සහන සැලසීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දැනටමත් ලබා දී ඇති අතර, අදාළ සහනයන් ප්‍රතිලාභී ගොවීන් වෙත ලබා දීමට මේ වන විට පියවර ගනු ලැබ ඇත. එසේම, හානියට පත්ව ඇති තේ, පොල් සහ රබර් නැවත වගා කිරීම සඳහා ද සහන සලසා දීමේ අවශ්‍යතාව පිළිබඳව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබ තිබේ. එම නිර්දේශ මත පදනම්ව, ආපදාවේ බලපෑම අනුව පහත සඳහන් පරිදි සහන සලසා දීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* තේ වගාව සඳහා උපරිම වශයෙන් හෙක්ටයාරයකට රුපියල් 500,000/- දක්වා.

* රබර් වගාව සඳහා උපරිම වශයෙන් හෙක්ටයාරයකට රුපියල් 400,000/- දක්වා.

* පොල් වගාව සඳහා උපරිම වශයෙන් හෙක්ටයාරයකට රුපියල් 750,000/- දක්වා.

12. **ශ්‍රී ලංකා රේගුව වෙත Oracle Exadata XIIM පද්ධතිය හා ඊට අදාළ මෘදුකාංග බලපත්‍ර සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා වන ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකා රේගුව වෙත Oracle Exadata XIIM පද්ධතිය හා ඊට අදාළ මෘදුකාංග බලපත්‍ර සැපයීම සඳහා යෝග්‍ය ආයතනයක් තෝරා ගැනීම පිණිස වන ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීම සඳහා 2024-08-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 03ක් ලැබී තිබේ. එකී ලංසු අතරින් තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් එකම ලංසුකරුගේ මූල්‍යමය ලංසුව ඇගයීමෙන් අනතුරුව, ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මත පදනම්ව, එම ප්‍රසම්පාදනය වසර 08ක කාලයක් සඳහා Millennium I.T.E.S.P. (Private) Limited වෙත රුපියල් මිලියන 2,197.96ක (බදු රහිත) මුදලකට පිරිනැමීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **ආර්ථික ආවේක්ෂණ කමිටුව (Committee on Economic Surveillance) ස්ථාපිත කිරීම**

මේ වන විට මැදපෙරදිග කලාපයේ පවතින යුධමය තත්ත්වය හේතුවෙන් ආර්ථිකයට අයහපත් බලපෑම් ඇති විය හැකි අස්ථාවර ගෝලීය පරිසරයක් නිර්මාණය වී ඇත. ඉතා කුඩා විවෘත ආර්ථිකයක් වශයෙන් ශ්‍රී ලංකාව බලශක්ති ආනයනය, මැදපෙරදිග කලාපයේ සේවය කරන විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන මුදල් ප්‍රේෂණ සහ එම කලාපය සමඟ ඇති වාණිජ හා ආයෝජන සම්බන්ධතා මත රඳා පැවතීම හේතුවෙන් බාහිර ආර්ථික කම්පනවලට නිරාවරණය වීමට සිදුව ඇත. එම තත්ත්වය යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු විය හැකි බලපෑම නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම, විවිධ ක්ෂේත්‍රවල ඇති වන අවදානම් ඇගයීම සහ පවතින තත්ත්වය නිරතුරුව සමාලෝචනය කරමින් ඒ අනුව ගත යුතු අත්‍යවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ගරු මුදල් සහ

ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය වශයෙන් කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ ආයතන ප්‍රධානීන් හා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත ආර්ථික ආවේක්ෂණ කමිටුව පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********